ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 මට්ටම
අවසාන පරීක්ෂණය - 2022/2023
LLU 3604 – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය 1
කාලය - පැය 3

---

දිනය : 2024 මාර්තු 03 වේලාව: ප.ව.01.30 - ප.ව. 04.30

---

**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**
**මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.**
**ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

1. 'මූලික නීතියෙන් ගම්‍ය වන රාජ්‍යයෙහි අධිකාරිය විස්තර කරන සංකීර්ණ අදහස්, ආකල්ප සහ හැසිරීම් රටා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය මගින් සංකේතවත් වෙයි'.
Done.E.Fehrenbacher, *Constitutions and constitutionalism in the slaveholding South* (University of Georgia Press,1989)1.

උක්ත ප්‍රකාශය ඇසුරින් ආණ්ඩුක්‍රමව්‍යවස්ථානුකූලවාදය තුළ පවත්නා මූලික අගයන් හා හරයාත්මක මූලධර්ම පැහැදිලි කරන්න.

(ලකුණු 20)

2. 'බලතල බෙදීම සම්බන්ධ යථාර්ථවත් විග්‍රහයකට අනුව, ආයතන තුනෙන් කිසිවකට අනෙකාගේ බලය ක්‍රියාත්මක කළ නොහැකි අතර කිසිදු තැනැත්තකු අනෙක් ආයතන ද්විත්වයෙහි සාමාජිකයෙකු නොවිය යුතුවක් මෙන්ම වෙන් වූ ආයතන වල ස්වාධීන ක්‍රියාවන් මගින් ඔවුනොවුන් අතර සංවරණ හා තුලන ක්‍රමවේදයක් නිර්මාණය කළ යුතුය.'

Benwell.R and Gay.O *The separation of powers* (Standard Note:SN/PC/06053 Last updated:15 August,parliament and Constitution Centre) 2.

ඇමෙරිකා එක්සත් ජනපදය ,එක්සත් රාජධානිය හා ශ්‍රී ලංකාවේ උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය අගයන්න.

(ලකුණු 20)

3. නිව්ස්ටර්ඩෑම් වනාහි දකුණු ආසියාවේ ඇති ප්‍රජාතාන්ත්‍රික සහ ද්විත්ව න්‍යායවාදී රාජ්‍යයකි. නිව්ස්ටර්ඩෑම් රාජ්‍යයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් මාර්ගගත අපහාසය වැළැක්වීම සම්බන්ධයෙන් වන නව නීතියක් සම්මත කර ගැනීමට අදහස් කරති.කෙසේ නමුත් මාර්ගගත අපහාසය වැළැක්වීමේ පනත් කෙටුම්පතෙහි ඇතැම් ප්‍රතිපාදන නිව්ස්ටර්ඩෑම්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනනුකූල වේ. ඊට අමතරව පනතේ 2 වන හා 4 වන වගන්ති නිව්ස්ටර්ඩෑම් රජය විසින් අපරානුමත කරනු ලැබූ ජාත්‍යන්තර සම්මුතියක ප්‍රතිපාදන සමග ගැටෙයි.මාර්ගගත

අපහාසය වැළැක්වීමේ පනත් කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කිරීම උදෙසා 'පුරවැසි බලය' නම් සිවිල් සමාජ සංවිධානයක් නිවිස්ටර්ඩෑම්හි ශ්‍රේෂ්ඨාධිකරණයෙහි පෙත්සමක් ගොනු කරන ලදී.මේ අතරතුර නිවිස්ටර්ඩෑම්හි විදේශ කටයුතු අමාත්‍ය බාලා ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වමින් ප්‍රකාශ කළේ ඕනෑම නීතියක් පැනවීමට පාර්ලිමේන්තුවට සීමා කළ නොහැකි සහ නිර්බාධිත බලයක් පවතින බවයි.

ඔබ 'පුරවැසි බලය'නම් සිවිල් සංවිධානයේ සාමාජිකයෙකු යැයි උපකල්පනය කරන්න.

නිවිස්ටර්ඩෑම්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සමාන යැයි සලකා, පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය යන සංකල්පය වෙත විශේෂ අවධානයක් යොමු කරමින් ඉහත සිද්ධිය සම්බන්ධයෙන් වාර්තාවක් සකසන්න.

(ලකුණු 20)

4. 'මෙලෙස රජයේ අනෙකුත් ආයතන ද්විත්වයෙහි අනිසි බලපෑම්වලින් තොරව අධිකරණ ව්‍යුහයෙහි සාමූහික ස්වාධීනත්වය මෙන්ම විනිශ්චයකාරවරුන් තම විනිශ්චයක කාර්යයන් ඉටු කිරීමේදී පැවතිය යුතු තනි පුද්ගල ස්වාධීනත්වයද අධිකරණයේ ස්වාධීනත්වය යන සංකල්පය මගින් ගම්‍ය වෙයි.'

Shetreet S. Judicial Independence: *New Conceptual Dimensions and Contemporary Challenges, In Judicial Independence*: *The Contemporary Debate* 594 (Shimon Shetreet & Jules Deschanes eds., 1985).

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙත අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

ඔබගේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන හා සමකාලීන උදාහරණ මගින් තහවුරු කරන්න.

(ලකුණු 20)

5. මයිකල්, සීලන්ඩ් නම් ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ කීර්තිමත් තරුණ මාධ්‍යවේදියෙකු වන අතර, ටොනල්ඩ් නම් දේශපාලනඥයෙකු හා හැරී නම් වෙනත් පුද්ගලයකු අතර සිදුවූ සිදුවීමක් වාර්තා කිරීමට යමින් සිටියේය.වාර්තාවට අනුව ටොනල්ඩ් විසින් හැරී හට පෞද්ගලික හේතුවක් මත පළිගැනීමක් ලෙස වෙඩි තැබීමක් සිදුකර ඇත.මයිකල් මෙම සිදුවීම වාර්තා කිරීමට යන විට බලහත්කාරයෙන් ඔහුව වෑන් රථයෙන් ඇද දමා, ඔහුගේ හිසකෙස් වලින් දැඩි ලෙස අල්ලා, පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ අඩන්තේට්ටම්වලට ලක්ව හේතු පැහැදිලි කිරීමකින් තොරව මයිකල්ව අත්අඩංගුවට ගන්නා ලදි. තවදුරටත් හැරීට වෙඩි තැබීම සම්බන්ධයෙන් තවම ටොනල්ඩ්ව අත්අඩංගුවට ගෙන නොමැති අතර සිදුවීම සම්බන්ධව පරීක්ෂා කිරීමට පවා පොලිස් නිලධාරීන් අපොහොසත් වී ඇත.පොලිස් නිලධාරීන් ප්‍රකාශ කරනු ලබන්නේ ටොනල්ඩ් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන හෙයින් ඒ හා සමාන ක්‍රමවේදය යටතේ ඔහුව අත්අඩංගුවට ගත නොහැකි බවයි.

නීතියේ ආධිපත්‍ය යන සංකල්පය ආශ්‍රයෙන් ඉහත සිද්ධිය විභාග කරන්න.

සීලන්ඩ්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සමාන යැයි උපකල්පනය කරන්න.
අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඔබේ පිළිතුරට සහාය කරගන්න.

**(ලකුණු 20)**

<u>6 (අ)</u> ප්‍රශ්නයට **හෝ** <u>6 (ආ)</u> ප්‍රශ්නයට **<u>පමණක්</u>** පිළිතුරු සපයන්න.

6. 6 (අ). 'එක් අපේක්ෂකයෙකු හෝ තවත් අපේක්ෂකයෙකු වෙනුවෙන් සිය ඡන්දය ලබාදීමෙන් පුද්ගලයෙකුගේ කැමැත්ත නිහඬව හා රහසිගතව ප්‍රකාශ කිරීම මහජන වේදිකාවක සිදුකරන වඩාත් චතුර කථනයකට වඩා භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස භුක්ති විඳීමකි'.

*Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others.* (1999) 1.SriLR 157.

උක්ත ප්‍රකාශයට අනුව , ශ්‍රී ලංකාවෙහි මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් වන නීතිමය ප්‍රතිපාදන හා මූලික මූලධර්ම පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

**<u>හෝ</u>**

6 (ආ). 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි පාඨයන්ගෙන් අර්ථය ලබාගැනීමේදි , ශ්‍රේෂ්ඨාධිකරණය නිශ්චිත අර්ථ නිරූපණ විධික්‍රම හෝ න්‍යායන් මත විශ්වාසය තබා ඇත. එනම් එම ක්‍රමවේද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පවත්නා ප්‍රතිපාදනයක සුවිශේෂී කරුණක් හඳුනාගැනීමේ මාර්ග වේ.'

Brandon J.Murill,*Modes of Constitutional Interpretation* (March 152018 Congressional Research Service).

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රතිපාදන අර්ථ නිරූපණයේදී විනිශ්චයකාරවරු උපයෝගී කරගනු ලබන විවිධ විධික්‍රම පිළිබඳ විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

ඔබගේ පිළිතුර අදාළ උදාහරණ මගින් තහවුරු කරන්න.

**(ලකුණු 20)**

7. දකුණු ආසියාවේ නිව්ලන්ඩ් නම් ප්‍රජාතාන්ත්‍රික දූපත් රාජ්‍යයෙහි නව විධායක ජනාධිපතිවරයා ලෙස තොම්සන් මහතා තේරී පත් විය.2023 වසරේ මාර්තු මස ජාත්‍යන්තර කාන්තා දිනයේදී ඔහු ප්‍රකාශ කරන ලැබුවේ එකම පවුලේ තිදෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2018 දී මරණ දණ්ඩනයට නියම කළ ඇන් හට ඔහු විසින් විශේෂ

ජනාධිපති සමාව ලබාදීමට තීරණය කළ බවයි. ඇන් හට විශේෂ ජනාධිපති සමාව ලබාදීම පක්ෂග්‍රාහී , අත්තනෝමතික හා නීති විරෝධී බවට සැලකිය යුතු ප්‍රමාණයක විවේචන මේ වන විට පවතී. නිව්ලන්ඩ්හි පාර්ලිමේන්තු ලේකම්වරයාට අනුව, සමාව ලබාදී ඇත්තේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා තවත් රාජ්‍ය ආයතන කිහිපයක් විසින් සකස් කරන ලද වාර්තා සලකා බැලීමෙනි.

නිව්ලන්ඩ්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන යැයි උපකල්පනය කරන්න.

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු වෙත යොමුවෙමින් මෙම සිදුවීම අගයන්න.

**(ලකුණු 20)**

8. පහත සඳහන් <u>ඕනෑම මාතෘකා දෙකක්</u> සම්බන්ධව කෙටි සටහන් ලියන්න.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය
2. පාර්ලිමේන්තු වරප්‍රසාද
3. ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම්
4. 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන කැපීපෙනෙන ලක්ෂණ.

**(ලකුණු 10×2= 20)**

***ශිමිකම ඇවිරිණි***